## මගෙන් වචනයක්..

උසස් පෙලට ඔයා මිඩීයා තෝරගන්න හේතු සැහෙන්න ඇති.ආසම සබ්ජෙක්ට් එක නිසා,ඉසෙඩ් එක වැඩි,ලේසි නිසා,යාලුවා කරන නිසා,එයා කරන නිසා,ගෙදරින් කිව්ව නිසා ඔය වගෙ හේතු ඇති.

ඒ මොන හේතුව තිබුනත් පොඩ්ඩො ඔයා විභාගෙට හොද ලකුණක් දාන්නම ඔනි.ඔයාට මොන හේතුවක් තිබ්බත් ඔයාගෙ දෙමව්පිය-න්ට තියෙන්නෙ එක හේතුවයි.ඒ මගෙ දුව මගෙ පුතා හොද තැනකට ඒවි කියන බලා-පොරොත්තුව විතරයි.ඒ බලාපොරොත්තුවත් හේතුවත් ඉශ්ඨ කරගෙන ඔයාගෙ හීනත් ඉශ්ඨ කරගෙන ඔයා විභාගේ ඉහලින්ම සමත් වෙන්න ඔනි.

ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙපා.සහභාගි වෙලා ෆෙල් ලකුනක් අරන් වැඩක් නැ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නනන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!

Advanced level 2023

# මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම නිතටම මීඩියා



Design by - Creativepixel.lk - Search us on fb/insta

පස් වැනි පාඩම

# සංස්කෘතිකාවබෝධය මාධ්‍යයේ ස්වාභාවය හා බලපෑම

Cultural Understanding Media Nature and Influence

විස්තරාත්මක කෙටිසටහන් පොත

Advanced level 2023
මීඩියා
COMMUNICATION & MEDIA STUDIES
මොළේටම නිතටම මීඩියා
විස්තරාත්මක කෙටිසටහන් පොත
ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටවින්ට ආදරෙන්

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටවින්ට ආදරෙන්

ලහිරු කේ. මදුශාන්
HNDIT , mass communication (UG)
076 3950730
071 0538308

### පුද්ගලයා කෙරෙහි මාධ්‍යයේ බලපෑම

ජන විඥානය කෙරෙහි බලපාය.

පුද්ගල ස්ව විඥානය කෙරෙහි බලපායි.

සමාජ විඥානය කෙරෙහි බලපායි.

පුද්ගල පෞරුෂය හැඩගැස්වීම කෙරෙහි බලපායි.

සංස්කෘතිය කෙරෙහි බලපායි.

### මාධ්‍යයේ සෘජු බලපෑමට නතුවන්නන්

ළමයින් ( ශිෂ්‍ය ශිෂ්‍යාවන්)
තරුණ තරුණියන්
කාන්තාවන්

ලහිරු කේ. මදුශාන්
LAHIRU K - MEDIA STU
search us on youtube,fb,Tiktok



## සංස්කෘතිය එහි ස්වභාවය හා විශේෂතා

සියලු සත්ත්වයන්ගෙන් මිනිසා ගුණාත්මක ලෙස වෙනස්ව හඳුනා ගැනීමේ මූලික සාධකය සංස්කෘතියයි.

සංස්කෘතිය යනු ප්‍රකෘතියේ විකෘතියයි.

**මානවයා හා සම්බන්ධ සියලු භෞතික සහ අභෞතික සාධක සංස්කෘතිය වේ.**

සංස්කෘතිය හඳුන්වනු ලබන Culture යන වචනය බිහි-වූයේ **ලතින් භාෂාවෙනි එය යන වචනයෙන් බිඳී ආවෙකි එහි මූලික අර්ථය යම් දෙයක් වගා කිරීම / පිළිසකර කිරීම / රෝපණය කිරීම යන්නයි.**

ඉංග්‍රිසි භාෂාවෙන් සංස්කෘතිය හඳුන්වන්නේ **culture** යනුවෙනි.

**සිංහල භාෂාවෙන් සංස්කෘතිය යන්නෙන් අර්ථවත් වන්නේ ශිෂ්ටාචාරය / සමාජය /ජීවන රටාව / සම්ප්‍රදායන් / උරුම / පුරුදු / ක්‍රම / කලාව /ඇඳුම් පැළඳුම් / උපකරණ ආදියයි.**

ක්‍රිපූ 234 149 අතර කාලයේ **මාර්කස් පර්සියස් කැටෝ** **culture** යන වචනය කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කලේය.

රෝම ජාතිකයන් විසින් මෙම වචනය භාෂාවේ සංස්කෘතිය,හැසිරීමේ සංස්කෘතිය,මිනිසාගේ සංස්කෘතිය ලෙස භාවිතා කරන ලදී.

රෝම කවියෙකු දාර්ශනිකයකු සහ රාජ්‍ය පාලකයෙකු වූ මාර්කස් ටුලිස් සීසර් විසින් මානව අධ්‍යාත්මිකත්වය අදාළව සංස්කෘතිය යන වචනය භාවිතා කරන ලදී.

සංස්කෘතිය යන වචනය ප්‍රථම වරට සංකල්පයක් ලෙස භාවිතයට පැමිණියේ 17 වන සියවසේදීය. **සැමුවෙල් පුෆෙන් ඩොර්ෆ් නම් ජර්මානු නීතිවේදියා** සංස්කෘතිය මිනිසගේ හස්ත නිර්මාණ එනම් කෘතිම ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල ලෙස අවබෝධ කර ගත්තේය.

## සංස්කෘතිය පිළිබඳ නිර්වචන

ඊ බී ටයිලර්
ආදි කල්පිත සංස්කෘතිය කෘතිය ~ 1871

සංස්කෘතිය හෝ සභ්‍යත්වය යනු දැනුම ඇදහිලි කලා නීති සදාචාර සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත් වන පුද්ගලයෙකු වශයෙන් ලබාගත් අනෙකුත් කුමන විධියක හෝ පුරුදු හා හැකියාවන් ඇතුළත් සංකීර්ණ සමස්තයයි.

බී මැලිනොව්ස්කි ~ 1944
සංස්කෘතියේ විද්‍යාත්මක න්‍යායන් කෘතිය

උපකරණ, පාරිභෝගික ද්‍රව්‍ය, විවිධ සමාජීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්ෂණ, මානව සංකල්පනා, ශිල්ප, විශ්වාස චාරිත්‍රයන්ගේත් අනුබද්ධ සමස්තයයි.

**Dynamic of mass communication ~** 2010

සංස්කෘතිය යනු සංකීර්ණ ක්‍රියාවලියකි. සමාජය එකට බැඳ තබන පොදු වටිනාකම්,විශ්වාස, සමාජ ක්‍රියාකාරකම්, නීති, කල්පිතයන් සංස්කෘතියට ඇතුළත් වේ.

## සංස්කෘතියේ ලක්ෂණ

සංකීර්ණ බව.
විවිධත්වයක් ඇති බව.
සමාජ බැඳීම් වලින් යුතු බව.
ගතික ස්වභාවය.
ලැදියා හා අවශ්‍යතා ඉටු කරන බව.
සංස්කෘතීන් අතර ඇති විවිධතා

## සංස්කෘතියේ ප්‍රභේද

01. සාම්ප්‍රදායික සංස්කෘතිය
02. ජන සංස්කෘතිය
03. සම්භාව්‍ය සංස්කෘතිය
04. ජනප්‍රිය සංස්කෘතිය
05. මාධ්‍ය සංස්කෘතිය
06. ගෝලීය සංස්කෘතිය

### 01. සාම්ප්‍රදායික සංස්කෘතිය

උත්තරීතර වූද පූජනීය වූද පාරිශුද්ධ වූද ජීවන ක්‍රියාකාරිත්වයේ සංවිධාන ප්‍රභේදයකි. උත්තරීතර සහ පූජනීය සංකේත පද්ධතියක් මත ගොඩනැගී තිබේ. මනුෂ්‍ය වර්ගයාගේ ඉතිහාසයේ දීර්ඝතම කාලයන්හි සහ වර්තමානයේ දී පවතින්නකි.

එය ජනතාවම නිර්මාණය කරන ඔවුන් ජෛව සමාජය සහ මානව ද්‍රව්‍යයේ ආවේණික ගති ලක්ෂණවලට අනුකූලවව නිර්මාණය වී ඇති අදාල ජනතාවගේ උරුමයකි.

### 02. සම්භාව්‍ය සංස්කෘතිය

මානව වාදය, බුද්ධිවාදය, විද්‍යාව, දර්ශනවාදය, අධ්‍යාපනය ආදී උසස් වටිනාකම් පාදකව වර්ධනය වූවකි. මානව සමාජ පරිණාමයේ නිශ්චිත මට්ටමක් (දියුණු) සමග සම්බන්ධ අතර නිර්මාණය කරනුයේ විශේෂ බුද්ධිමය හා කලාත්මක හැකියාවන් ඇති පුද්ගලයන්ය.

මෙහි නිර්මාණ උසස් කලාත්මක සහ සෞන්දර්යාත්මක වටිනාකමකින් අනූන වන අතර බුද්ධිමය හා සදාචාරාත්මක මට්ටම් ද උසස් තලයක පවතී.



මානවයාගේ ආරම්භයේ සිටම ඓතිහාසික වශයෙන් ඇතිවූ විවිධ මාධ්‍යයන් (සම්ප්‍රදායික / ජන /නව) පුද්ගලයා හා සමාජය කෙරෙහි සිදු කර ඇති බලපෑම සමාජ සංවර්ධන ක්‍රියාවලියත් සමග උත්සන්න වී තිබේ.

එක් එක් මාධ්‍ය ප්‍රභේද සහ ස්වරූප පුද්ගලයා සහ සමාජය වෙත සිදු කරන බලපෑම ඒ ඒ මාධ්‍යයේ ප්‍රභේදය සහ ස්වරූපය මෙන්ම විවිධ මාධ්‍ය අතර ඇති සම්බන්ධතාවයේ ස්වභාවය අනුව විවිධ මට්ටම් ගනී.

### සම්ප්‍රදායික මාධ්‍යයේ සමාජ බලපෑම

සාම්ප්‍රදායික මාධ්‍ය යනු,

ප්‍රාථමික ශ්‍රව්‍ය හා දෘශ්‍ය ක්‍රියාකාරකම්, ජනකවි, ජනකතා, ශාන්ති කර්ම හා යාතු කර්ම, ගැමි නාටක ආදියයි.

බලපෑම
මෙම මාධ්‍ය එකල පැවැති සාම්ප්‍රදායික සංස්කෘතියේ එක් අංගයක් පමණක් වීම.
සමාජය කෙරෙහි යහපත් අරමුණකින් ක්‍රියාත්මකවීම යහපත් බලපෑම් දක්නට ලැබීම.

### ජනමාධ්‍යයේ සමාජ බලපෑම

ජනමාධ්‍ය යනු,

නූතන යුගයේ බිහිවූ පුවත්පත ඇතුළු මුද්‍රිත මාධ්‍ය, ඡයාරූප, සිනමාව, ගුවන්විදුලිය, රූපවාහිනිය යන මාධ්‍යයන්ය.

බලපෑම
මුද්‍රිත මාධාරයට සාපේක්ෂව විද්‍යුත් මාධ්‍ය බලපෑම ප්‍රබලය. ඒ අතුරින් වඩාත්ම ප්‍රබල රූපවාහිනියයි. කර්මාන්තමය ස්වරූපයෙන් ක්‍රියාත්මක විම ආර්ථික හා දේශපාලනික අරමුණු මුල් විම හේතුවෙන් අහිතකර බලපෑම් දක්නට ලැබේ.

පශ්චාත් නූතන යුගයේ අන්තර්ජාලය ඇතුළු සමාජ මාධ්‍ය බිහිවීමත් සමග සංස්කෘතිය බිහිවීමේ පැවැත්මේ, ක්‍රියාකිරීමේ, ව්‍යාප්තිකරණයේ, යාන්ත්‍රණයේ සහ මාදිලියේ ප්‍රබල විපර්යාස රැසක් ඇතිවිය.

## සීතල යුද්ධය ( 1947 ~ 1991)

දෙවන ලෝක යුද්ධයෙන් පසු සෝවියට් සංගමය සහ එක්සත් ජනපදයත් ඔවුන්ගේ සහභායකයිනුත් අතර ඇතිවූ දේශපාලනික ආකෘතියකි. මීට සම්බන්ධ වූ පාර්ශ්වයන් විසින් එකිනෙකට බලපෑම් කිරීමේ මාධ්‍යයක් ලෙස සංස්කෘතිය යොදා ගෙන තිබේ.

## දෙවන ලෝක යුද්ධයේ නිමාව ( 1947 - 1950 )

යුද්ධය නිමවීමෙන් පසු ඇමෙරිකානු ව්‍යාපාරිකයින්ට දේශපාලඥයින්ට සහ රාජ්‍ය සේවා නිලධාරීන්ට වෙනත් රටවල ජාතීන් ජනවර්ග සහ සංස්කෘතීන් සමග වැඩ කටයුතු කරගෙනයාම සඳහා ඒඒ රටවල සංස්කෘතීන් සම්ප්‍රදායයන් ද අවබෝධකර ගැනීමේ අවශ්‍යතාව මතුවිය.( ඇමෙරිකාව මේ සඳහා 1947 දී විදේශ සේවා ආයතනය පවා ආරම්භ කොට තිබේ).

## පර්යේෂකයින් සහ ඔවුන්ගේ කෘති

එඩ්වර්ඩ් ටී හෝල් සහ ජෝර්ජ් එල් ට්‍රයිගර් *
සංස්කෘතිය සන්නිවේදනය ලෙසඃ ආකෘති සහ විශ්ලේෂණ කෘතිය

එඩ්වර්ඩ් ටී හොල් ( 1950)
නිහඬ භාෂාව

## සංස්කෘතිය කෙරෙහි ජනමාධ්‍යයන්ගේ බලපෑම

සංස්කෘතිය කෙරෙහි ජනමාධ්‍යයන්ගේ බලපෑම ආකාර කිහිපයක් යටතේ දැක්විය හැකිය.

01. පළමු ආකාරය

**මානසික බලපෑම**
**චර්යාමය බලපෑම**

02. දෙවන ආකාරය

**ධනාත්මක බලපෑම**
**ඍණාත්මක බලපෑම**

03. තෙවන ආකාරය

**යහපත් බලපෑම ( ඉෂ්ට)**
**චර්යාමය බලපෑම (අනිෂ්ට)**

04. සිව්වන ආකාරය

**සක්‍රීය බලපෑම**
**නිෂ්ක්‍රීය බලපෑම**



## 03. ජන සංස්කෘතිය

සාම්ප්‍රදායික සමාජයන්හි මූලික හා අධිපත්‍යසික සංස්කෘතියයි සාම්ප්‍රදායික සංස්කෘතිය හා ජන සංස්කෘතිය අතර පොදු භාවයක් ද පවතී ජනයාගේ සාමූහික ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයකි ජනතා උරුමයේ අවියෝජනීය කොටසකි.

සාමූහික ප්‍රපංචයකි.

එහි නිර්මාණ අකර්තෘකාරක වේ.

ජනතාවගේ බිම් මට්ටමේ අවශ්‍යතා හා ලැදියා නියෝජනය කරයි.

ජනතාවගේ නිර්මාණයක් වන අතර එහි ඇත්තේ පොදු වටිනාකම්ය.

දෛනික ශ්‍රම ක්‍රියාකාරිත්වය සමග අවියෝජනීයව සම්බන්ධ වේ.

## 04. ජනප්‍රිය සංස්කෘතිය

ජන සංස්කෘතියේ වඩාත්ම ජනාකර්ෂණීය කොටස වේ. එනම් ජන සංස්කෘතියේ සම්පිණ්ඩිත සාරයයි. ජන සංස්කෘතියේ හා ජනප්‍රිය සංස්කෘතියේ පොදු ලක්ෂණ පවතී.

ජන සංස්කෘතියේ උපරිම ස්වරූපයයි නොගැඹුරු සරල මහා පරිමාන නිශ්පාදන සහිත සියලු දෙනාටම සමීප වීම යන ලක්ෂණ වලින් යුක්ත වේ.

මෙහි කලාංග පහසුවෙන් රසවිඳිය හැකි බුද්ධිමය සදාචාරාත්මක සහ කලාත්මකමට්ටමෙන් හීන ඒවා වේ.

වාණිජත්වය මිල තීරණාත්මක සාධකයන්ය.

සමාන බුද්ධි මට්ටමක් සහිත මධ්‍යම ප්‍රමාණයේ හැකියාවන් ඇති මතුපිට දැක්මක් සහිත පුද්ගලයන් මෙහි නිර්මාපකයන්ය.

වර්තමානයේ කර්මාන්තයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

## 05. මාධ්‍ය සංස්කෘතිය

විඥාපන ( තොරතුරු) සමාජයේ සංස්කෘතියයි.
මාධ්‍ය ක්ෂේත්‍රයෙහි පවතින ද්‍රව්‍යමය සහ අධ්‍යාත්මික වටිනාකම් වල සමස්තයයි.
පුද්ගලයා සමාජානුයෝජනය කිරීම සඳහාත් සමාජ මතය හැඩගැස්වීම සඳහාත් උපකාරවන්නා වූ මානව සංහතිය විසින් සිය සංස්කෘතික ඓතිහාසික ප්‍රගමණයේ දී ගොඩනගා ගන්නා ලද තොරතුරු සන්නිවේදනාත්මක මාධ්‍යයන්ගේ සම්ප්‍රේෂණය වේ.

මාධ්‍ය ලෝකය තුළ බිහි වූ මොහොතෙහි නොව සමාජය කෙරෙහි මාධ්‍යයේ බලපෑම
පසුකාලීනව බිහිවිය.

මාධ්‍ය පාදකව සිදුවන සමස්ත මානව ක්‍රියාවලිය මාධ්‍ය සංස්කෘතිය වේ.

## මාධ්‍ය සංස්කෘතියට අයත් විවිධ සංස්කෘතීන්

තොරතුරු නිෂ්පාදනයේ සංස්කෘතිය
තොරතුරු සම්ප්‍රේෂණයේ සංස්කෘතිය
තොරතුරු සංජානනයේ සංස්කෘතිය
තොරතුරු අවබෝධයේ සංස්කෘතිය
තොරතුරු පරිහරණයේ සංස්කෘතිය
තොරතුරු ඇගයීමේ සංස්කෘතිය
තොරතුරු සන්දේශ නිර්මාණකරණයේ සංස්කෘතිය

## මාධ්‍ය සංස්කෘතියේ කාර්යයන්

විඥාපන තොරතුරු කාර්යය
සන්නිවේදනාත්මක කාර්යය
දෘෂ්ටිවාදී කාර්යය
ප්‍රතිෂ්ඨාපන (විනෝදය) කාර්යය
නිර්මාණාත්මක කාර්යය
අනුකලනාත්මක කාර්යය
අතරමැදි කාර්යය

## මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ අදහස් දක්වන ලද විද්‍යාඥයන්

### වෝල්ටර් බෙන්ජමින්

මාධ්‍ය සංස්කෘතිය සඳහා අවශ්‍ය වූ සංකල්පීය පදනම නිර්මාණය කළ පුරෝගාමියායි.

තාක්ෂණික ප්‍රතිනිෂ්පාදනයේ අති දැවැන්ත හැකියාව නිසා මුල් කෘතිය සහ අනු පිටපත (කොපිය) අතර පවතින සමාජීය සහ කලාත්මක වෙනස්කම් අතුරුදහන්වන බව පෙන්වා දුන්නේය.

විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව නිසා කලාත්මක සහා මාධ්‍ය පෙළෙහි සිදුවන වෙනස්කම් විග්‍රහ කළේය.

### මාර්ෂල් මැක්ලුහන්

මාධ්‍ය සංස්කෘතිය සංකල්පය නිර්මාණය කිරීමෙහිලා සහ පෝෂණය කිරීමෙහිලා විශාල සංකල්පීය දායකත්වයක් සැපයු පුද්ගලයායි.

ප්‍රථම වරට මාධ්‍ය සහ සමාජය මාධ්‍ය හා සංස්කෘතිය, මාධ්‍ය සහ සන්දේශ, මාධ්‍ය සහ අර්ථ, මාධ්‍ය හා මාධ්‍ය සන්දේශ සංජානනය පුළුල්ව විග්‍රහ කිරීම.

**මානව ශිෂ්ටාචාරයේ ප්‍රධාන අවධි 03කට බෙදා විග්‍රහ කිරීම.**

01. ප්‍රාග් ලිඛිත සංස්කෘතික අවධිය
02. ලිඛිත මුද්‍රිත සංස්කෘතික අවධිය
03. දෘශ්‍ය සංස්කෘතික අවධිය



# අන්තර් සංස්කෘතික අධ්‍යයනය

විවිධ සංස්කෘතීන් තුලනය කිරීමයි මෙහිදී එක් සංස්කෘතියක පවතින සමාජ සාධක අධ්‍යයනය කොට එකී සාධක වෙනත් සංස්කෘතික සාධකයන් හා සංසඳනය කිරීම අරමුණු කරගනී. (එක් සංස්කෘතියක් අධ්‍යයනය කිරීමෙන් හඳුනාගනු ලැබූ සාරධර්ම මානව චර්යාවන් ජනශ්‍රැතිකාංග ආදිය වෙනත් සංස්කෘතියක එම සාධක සමග සසඳා බැලීමයි.)

මෙම අධ්‍යයනයෙන් හෙළිදරව් වන එක් සංස්කෘතියක් පිළිගන්නා දේ තවත් සංස්කෘතියක් විසින් පිළිගැනීම ,නොපිළි ගැනීම ආගන්තුක යැයි සැලකීම සිදු විය හැකිය.

වෙනත් සංස්කෘතියක් දැන හඳුනා ගැනීමේ කුතුහලය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම පැවැති පුරුද්දකි.

විවිධ මානව කණ්ඩායම් අතර සංස්කෘතික චර්යාත්මක හැසිරීම් රටා ආකල්ප ආදිය අතර සම විෂමතා සොයා බැලීමටත් සමහර සංස්කෘතික සම්ප්‍රදායන් සැලකිය යුතු මට්ටමෙන් වෙනස් වන්නේත් සමහර අවස්ථා වලදී එකිනෙකට පරස්පර වන්නේත් ඇයිද යන්න සොයා බලා අනාවරණය කර ගැනීමට අතීත මිනිසා ප්‍රයත්න දරා තිබේ.

තමන්ගේ සංස්කෘතිය උසස් ලෙස දැකීමටත්, සෙසු සංස්කෘතීන් පහත් ලෙස සැලකීමටත් ක්‍රියාකිරීම සහ උසස් පහත් ලෙස සංස්කෘතීන් වෙන් කිරීමත් හේතුවෙන් විවිධ සංස්කෘතික ගැටුම් ඇතිවීම පදනම් කර ගනිමින් සංස්කෘතීන් පිළිබඳ අධ්‍යයනයක් සිදු කලයුතු බව විද්වතුන් නිර්දේශ කිරීම.

සන්නිවේදන තාක්ෂණයේ දියුණුව සමග ලෝකයේ සංස්කෘතීන් පිළිබඳව සමීපව අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය.

දේශපාලනික ගවේෂණ කටයුතු සඳහා සංස්කෘතියෙන් සංස්කෘතියට ඒවායේ වෙසෙන මිනිසුන් හුවමාරුවීම හේතුකොට ගෙන ඇතිවූ සංස්කෘතික අනවබෝධයන් හා ඝට්ටනයන් පරීක්ෂා කර බැලීමේ හා ඒවා මග හරවා ගැනීමේ පියවරක් වශයෙන් අවශ්‍ය වීම.

ජාත්‍යන්තර මට්ටමෙන් ඉදිරිපත්වන මාධ්‍ය සන්දේශ තේරුම් ගැනීම සඳහා ඊට පාදක වචන සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගැනීමේ අවශ්‍යතාවය.

## ගෝලීයකරණය

මූලික වශයෙන් ආර්ථික ක්‍රියාවලියකි. නිෂ්පාදන බලවේගවල සහ නිෂ්පාදන සම්බන්ධතාවල ලෝක පරිමාණව ව්‍යාප්තවීම සහ සියලු ජාතික, ප්‍රාදේශීය නිශ්පාදන මාදිලි අභිබවා ගිය පාරජාතිය බහු ජාතික සමාගම්වල ක්‍රියාකාරිත්වය මගින් ලොව පුරා විසිරී පැතිරී පවතින විවිධ ආර්ථික ක්‍රියාකාරකම් ඒකීය සමස්තයක් ලෙස ඒකාබද්ධව මෙහෙයවීම ආර්ථිකයේ ගෝලීයකරණයයි.

ආර්ථිකයේ ගෝලීයකරණයට සමගාමීව දේශපාලන-යේ, සංස්කෘතියේ, අධ්‍යාපනයේ, මාධයේ ආදී මානව ක්‍රියාකාරිත්වයේ සියලුම ක්ෂේත්‍ර ගෝලීයකරණයට ලක්වේ.

මානව සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන-යේ නිර්මාණය වී ඇති ගෝලීය උපරි සමාජය සහ ඊට අයත් උපරි ආර්ථිකයේ, උපරි රාජ්‍යයේ, උපරි දෘෂ්ටි-වාදයේ, උපරි සංස්කෘතියේ, උපරි මාධ්‍ය සංස්කෘතියේ බලපෑමට, ආධිපත්‍යයට නතුවීම සමකාලීන ගෝලීය වර්ධනයේ විශේෂත්වයකි.

### ගෝලීය සංස්කෘතියේ ලක්ෂණ

ජාතික සංස්කෘත්න්ට ආවේණික වූ ආහාර, සංස්කෘතිය, භාෂා භාවිතය, විලාසිතා සංස්කෘතිය, අධ්‍යාපන සංස්කෘතිය, ජාතික චින්තනය සංස්කෘතිය ආදිය තර්ජනයට ලක්වීම.

සියලු ජාතික සංස්කෘතීන් ඒකාකාරවීම සහ සමජාතික-රණය වීම.

ජාතික මාධ්‍ය ආයතන වල ආධිපත්‍යය ගෝලීය උපරි සමාජය නියෝජනය කරන පාරජාතික සමාගම්වල මාධා නිෂ්පාදන විසින් හිමිකර ගෙන සිටීම.

ගෝලීය තොරතුරු ප්‍රවාහයෙන් වැඩි ප්‍රතිශතයක් ගෝලීය උපරි සමාජ සමාගම් වලට හිමිවීම.

මාධ්‍ය සන්දේශ මගින් බලහත්කාරයෙන් ලෝකයට ආ-රෝපණය කරනුයේ බටහිර ජන සංස්කෘතියේ ප්‍රමිතීන් වීම. ( යුරෝපා ප්‍රමිති / බටහිර ආකෘති )

සිනමාව, රූපවාහිනී, සංගීත, ප්‍රාසංගික කලා, ලේඛන ආදි නිර්මාණ තුළින් ස්වදේශකන්වය අහෝසි වී යාම.



මාධ්‍ය සංස්කෘතිය යන්නට මිනිස් ක්‍රියාකාරිත්වයට ආධාරවන සියලු මාධ්‍ය අතුළත් බව විග්‍රහ කිරීම.

මිනිසාගේ දේහයේ පංචේන්ද්‍රියන්ගේ සංවේදනවල සහ සක්‍යතාවල සෘජු තාක්ෂණික ප්‍රසාරණයක් සහ ව්‍යා-පතියක් ලෙස සිදුවීමට සමගාමීව ඒවා මිනිසාගෙන් ඉවත් වී පරාරෝපනය වී ඒවාම මිනිසාට එරෙහිව බාහිර බලවේගයක් ලෙස ක්‍රියා කරන බව විග්‍රහ කරයි.

### මාධ්‍ය සංස්කෘතිය තුළ සන්දේශවල සහ කලා නිර්මා-ණවල විශේෂතාංග

විශේෂත්වය, අද්විතීයත්වය, ප්‍රභාව ගුප්තභාවය, පරමාදර්ශීභාවය, සදාතනිකභාවය, උත්තෘෂ්ටභාවය, ශ්‍රේෂ්ඨත්වය, විකාශය වී ගොස් ඒවා අර්ථ හා රස රහිත එනම් හරසුන් හා රසසුන් පෙළ බවට පත්වීම.
(උදා: වර්තමාන ජනමාධ්‍ය සන්දේශ)

සාම්ප්‍රදායික ක්ෂේත්‍රයෙන් ඉවත්කොට එහි අද්විතීය-භාවය හා ගුණාත්මකභාවය අහිමි කර එය ජන හා ප්‍රාථමික දෙයක් බවට පත්වීම.

පෙළෙහි මූලික ලක්ෂණ වන්නේ එය පෞද්ගලික සතුටේ ප්‍රීතියේ වින්දනයේ පාරිභෝජනයේ සිට ප්‍රාථමික ජන පරිභෝජනයේ විහිදී ගිය බහුවිධ ස්වරූප සහ ශෛලීන් බවට පත්වීම.

### ගෝලීය සංස්කෘතිය

ගෝලීය උපරි සමාජයේ අනු දැනුම සහ මගපෙන්වීම යටතේ ලොව සියලු ජාතික වාර්ගික සංස්කෘතීන් විනාශ කරමින් ව්‍යාප්තවන ජනසංස්කෘතිසයයි.

සාම්ප්‍රදායික ජන සහ ජාතික සංස්කෘතින්ට ප්‍රතිවිරුද්ධ වූවකි අධිරාජ්‍යවාදී ආකෘතියෙන් ක්‍රියාත්මක වීමකි.

### ගෝලීය සංස්කෘතිය හා විද්‍යාඥයෝ

**ජොන් මැක්ලීන්**
ගෝලීයකරණය ගෝලීය සම්ප්‍රදාය යන සංකල්ප භාවිතයට එක් කිරීම * 1981

**රොබර්ට්සන්**
ගෝලීය සංස්කෘතිය යන අදහස මුල් වරට හඳුන්වා දීම * 1985